// සෙල්සිය පත්‍රය

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2468/11 - 2025 දෙසැම්බර් මස 23 වැනි අඟහරුවාදා - 2025.12.23**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**(262 අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ(1)(අ) වගන්තිය යටතේ අත්තනගල්ල ප්‍රාදේශීය සභාවේ සභික ධූරයේ පුරප්පාඩුවක් පිරවීම**

ඉල්ලා අස්වීම හේතුකොට ගෙන අත්තනගල්ල ප්‍රාදේශීය සභාවේ සභික ධූරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද;

ඉහත කී ආඥාපනතේ 66අ(1)(අ) වගන්තිය යටතේ අත්තනගල්ල ප්‍රාදේශීය සභාවේ අංක 10 කටුවස්ගොඩ කොට්ඨාසයට තේරී පත්වූ වන්නකුවත්ත මිටිවඩුගේ හංසිකා පෙරේරා අයත් වන්නා වූ ජාතික ජන බලවේගය නම් වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරා පත්කර ගනු ලැබිය යුතුයැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, එම පක්ෂයට අයත් වන්නා වූ ද, එම අත්තනගල්ල ප්‍රාදේශීය සභාවේ අංක 10 කටුවස්ගොඩ කොට්ඨාසයේ සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් ඒ පුරප්පාඩුව පිරවීම සඳහා ජයසේකර සුබසිංහ ආරච්චිගේ ධම්මිකා ජයසේකර නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද;

අත්තනගල්ල ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරී විතාන අප්පුහාමිල්ලාගේ රවීන්ද්‍ර වික්‍රමසිංහ වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 66අ(1)(අ) වගන්තිය ප්‍රකාරව ක්‍රියා කරමින් ජයසේකර සුබසිංහ ආරච්චිගේ ධම්මිකා ජයසේකර අත්තනගල්ල ප්‍රාදේශීය සභාවේ අංක 10 කටුවස්ගොඩ කොට්ඨාසයේ සභිකයා වශයෙන් තෝරා පත් කර ගත් බව මෙයින් ප්‍රකාශ කරමි.

**ඩබ්ලිව්. ඒ. රවීන්ද්‍ර වික්‍රමසිංහ,**
තේරීම්භාර නිලධාරී,
අත්තනගල්ල ප්‍රාදේශීය සභාව.

2025 දෙසැම්බර් මස 23 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
ගම්පහ.

EOG 12 - 0217

1A - PG 7423 — 09 (2025/12) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*